# NDDCB NEWSLETTER

**VOLUME : 32**

**April - June : 2022**



**National Dangerous Drugs Control Board**

**Ministry of Defence**

- **මඟපෙන්වීම**
- **විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය**
  **සභාපතිනිය**
- **ආශා ජයවර්ධන මහත්මිය**
  **අධ්‍යක්ෂ ජනරාල්**

**සංස්කාරක මඩුල්ල**

- හද්‍රානි සේනානායක - අධ්‍යක්ෂ පර්යේෂණ
- තමර දර්ශන - සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ
- නිලුක්ෂි තිසේරා - පර්යේෂණ නිලධාරී
- හංසිකා කේතුමාලි - පර්යේෂණ නිලධාරී


**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
නො. 383,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**Tel – 011 2868794 – 6**

**Fax – 0112 868792 - 1**

**Email – mail@nddcb.gov.lk**

**Fb – National Dangerous Drug Control Board.**


## Vision

"Build a Drug Free Health and Secured Nation"

## දැක්ම

"මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

## Mission

"Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals"

## මෙහෙවර

"අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම".



වර්තමානය වන විට සමාජය තුළ ජීවත්වන මිනිසා මුහුණදෙනු ලබන සමාජ හා ආර්ථීකමය ගැටලු අතර මත්ද්‍රව්‍ය දුර්භාවිතය ද ප්‍රධාන සමාජ ගැටලුවක් බවට පත් වී ඇත. එවන් පසුබිමක "සෞඛ්‍ය සහ මානුෂීය අර්බුද හමුවේ මත්ද්‍රව්‍ය අභියෝග ජයගනිමු" යන තේමාව මූලික කර ගනිමින් මෙවර ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනය යෙදී ඇත. මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය පවුල් ඒකකය තුළින් ආරම්භ කර සමස්ත සමාජය දක්වා විහිදී යා යුතු පුළුල් ක්‍රියාදාමයක් වේ. ආයතනික වශයෙන් මෙන්ම පුද්ගල මට්ටමෙන් අනාගත දරු පරපුරෙහි සුරක්ෂිතභාවය කෙරෙහි මැදිහත්වී කටයුතු කිරීම පුරවැසියාගේ මූලික වගකීමක් වේ.

සෞඛ්‍ය අර්බුද සහ මානුෂීය අර්බුද ඇතිවීම කෙරෙහි මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත බලපෑම් හේතුවන අතර එවැනි අර්බුදවලට මුහුණපා සිටින පුද්ගල කණ්ඩායම් සහ ප්‍රජාවන් වෙත සේවාවන් සැපයීමේදී නැවත වරක් එම අර්බුද බාධාවන් වන අවස්ථා ඇත. කුමන අර්බුදයන් මධ්‍යයේ වුවද අඛණ්ඩ සේවාවක් සැපයීම සේවාවන් සපයන ආයතන සහ නිලධාරීන්ගේ වගකීම වේ. අඛණ්ඩ සේවාවක් තහවුරු කිරීම උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සැමවිටම වගකීම් දරන අතර සියලු පාර්ශ්වයන් ඒ සඳහා සක්‍රීය දායකත්වය දක්වනු ඇතැයි අපේක්ෂා කරමි.

**විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු**

**සභාපතිනිය**

## මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර දින සැමරුම

"සෞඛ්‍ය සහ මානුෂිය අර්බුද හමුවේ මත්ද්‍රව්‍ය අභියෝග ජයගනිමු" තේමාව පෙරදැරි කරගනිමින් මෙවර ජූනි මස 26 වන දිනට යෙදී තිබුණ මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර සැමරුම් දිනය වෙනුවෙන් විශේෂ වැඩසටහනක් 2022.06.23 දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණ.

මේ අවස්ථාව සඳහා සර්ව ආගමික සංහිදියාව සනිටුහන් කරමින් සියලු ආගමික නායකයින් සහභාගි වූ අතර මත්ද්‍රව්‍ය ගැටලුවට ආගමික මැදිහත්වීම කෙසේ සිදුවිය යුතු ද? යන්න පිළිබඳ කෙටි අනුශාසනාවන් කිහිපයක් ද සිදු කරන ලදි.

වැලිකඩ පොලිස් ස්ථානාධිපතිතුමන් ඇතුළු පොලිස් නිලධාරීන්, සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, රාජගිරිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරිතුමිය ඇතුළු කාර්යාලයේ නිලධාරීන් සහ සිසු සිසුවියන් මෙන්ම කෝට්ටේ නගර සභාවේ නාගරික මන්ත්‍රීන් ඇතුළු රාජ්‍ය සහ පෞද්ගලික ආයතන රැසක නිලධාරීන්ගේ සහභාගීත්වය ද මෙහිදී සුවිශේෂී විය.

තවද, රාජගිරිය ප්‍රදේශයේ ඉහළ මත්ද්‍රව්‍ය අවදානමක් සහිත ඔබේසේකරපුර සහ බණ්ඩාරනායකපුර ප්‍රජාව නියෝජනය කරමින් "සුරකිමු ගම" සංවිධානයේ ලේකම්තුමන් ඇතුළු නිලධාරීන් ද, වැඩිහිටි බල මණ්ඩලයේ නිලධාරින් සහ කාන්තා සමූපකාර සමිති නියෝජනය කරමින් නිලධාරින් සහ එහි සමාජිකයින් ද, චයිල් ඇක්ශන් ලංකා ආයතනයේ නිලධාරින් හා දරු දැරියන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාව සඳහා සහභාගී වූ අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ගරු සභාපතිතුමිය, අධ්‍යක්ෂ ජනරාල්තුමිය, අධ්‍යක්ෂකවරුන් සහ සහකාර අධ්‍යක්ෂකවරුන් ඇතුළු මණ්ඩලයේ නිලධාරීන් ද මේ සඳහා සම්බන්ධ විය.

මෙම උත්සවයේ ප්‍රධාන අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකා මොබිටෙල් ආයතන විසින් ලබාදුන් අතර "මතින් නිදහස් ජාතියක් - සෞභාග්‍යමත් දේශයක්" නිර්මාණය වෙනුවෙන් මෙම සියලු පාර්ශ්වයන්ගේ දායකත්වය සහ සහයෝගය ලබා ගැනීමට හැකිවීම අප මණ්ඩලය ලැබූ තවත් එක් ජයග්‍රහණයක් ලෙස ද දැක්විය හැක.










## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

**Message**

According to the National Policy Framework "Vistas of Prosperity and Splendour" our state policy is to create a 'Drug-Free Nation-Prosperous Country' with the aim of effectively eradicating the drug menace from Sri Lanka.

I commend the National Dangerous Drugs Control Board for celebrating this day annually, coinciding with the International Day against Drug Abuse and Illicit Trafficking, fulfilling its national responsibility towards the people of Sri Lanka.

The most important factor that leads to the development of a country is not only the physical resources but the human capital that they have developed. At present, the drug menace is not limited to one country or one nation but it is affecting the entire world.

"Share Drug Facts to Save Lives", the theme of the International Day against Drug Abuse and Illicit Trafficking 2022 is extremely timely. We all need to be more vigilant in rescuing today's youth and children from the drug menace.

I appreciate the service of the National Dangerous Drugs Control Board, which operates under the auspices of the Ministry of Defence, with full state intervention, as the foremost state institution responsible for creating drug prevention educational programmes, providing treatment to the drug dependants and rehabilitation of drug dependants in Sri Lanka.

I wish the National Dangerous Drugs Control Board every success to prevent and control the abuse of dangerous drugs.

**Gotabaya Rajapaksa**

**June 24, 2022**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கை சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

# ගරු ආරක්ෂක ලේකම්තුමාගේ පණිවුඩය

## ආරක්ෂක ලේකම් විසින් මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනය වෙනුවෙන් නිකුත් කරනු ලබන පණිවුඩය



[illegible]

[illegible]

[illegible]

[illegible]

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
[illegible]
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය

## මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව පවත්වන ලද සැමරුම් වැඩසටහන්

- මොරටුව, රත්මලාන හා දෙහිවල යන ප්‍රදේශවල මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව උපදේශන වැඩසටහන් හා ප්‍රජා ප්‍රතිකාර වැඩසටහන් සම්බන්ධව පුද්ගලයන් දැනුවත් කිරීම් සිදුකරන ලදි. තවද රත්මලාන, මොරටුව, වලව්වත්ත යන ප්‍රදේශ වල ප්‍රජාව හා වෙළඳ සංගම්වල ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.









- රත්මලාන ධර්මාරාම විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන්ගේ  දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩටහනක් 2022.06.18 වන දින ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීති විරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ දිනයට සමගාමීව පවත්න ලදි.




- මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර සැමරුම් දිනයට සමගාමීව පුත්තලම නගර සභාව විසින් සර්ව ආගමික නායකයින්, දේශපාලන අධිකාරිය, සිවිල් සංවිධාන හා එක්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් පුත්තලම නගර සභා ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදි. එමෙන්ම එදිනට සමගාමීව වයඹ ගුවන් විදුලිය සමඟ සජීවී සංවාදාත්මක වැඩසටහනක් පවත්වන ලදි.






- 2022.06.24 වන දින දී මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර සැමරුම් දිනයට සමගාමීව දැරණියගල මැලිබන් ඇගලුම් ආයතනයේ දී සේවක සේවිකාවන් 1500 දෙනා දැනුවත් කරන ලද අතර 1927 ක්ෂණික දුරකථන අංකය ප්‍රචාරණයට අදාළ අත් පත්‍රිකා බෙදා දීම සිදු කරන ලදි.

එමෙන්ම 2022.06.28 වන දින ද ජාත්‍යන්තර සැමරුම් දිනයට සමගාමීව තුල්හිරිය මෙත්ලිය ආයතනයේ දී සේවක සේවිකාවන් 1500 ක් දෙනා දැනුවත් කරන ලද අතර 1927 ක්ෂණික දුරකථන අංකයට අදාළ අත් පත්‍රිකා බෙදා දීම සිදු කරන ලදි.









- මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර සැමරුම් දිනයට සමගාමීව 2022.06.27 වන දින වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 1927 ක්ෂණික දුරකථන අංකය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පෝස්ටර්, අත් පත්‍රිකා හා ස්ටිකර් 3500ට අධික සංඛ්‍යාවක් ප්‍රචාරය සිදු කරන ලදි.










- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව 2022.06.27 දින කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කේන්ද්‍ර කරගනිමින් 1927 ක්ෂණික දුරකථන අංකය ප්‍රචාරණය කිරීමට අදාළ පෝස්ටර් ප්‍රදර්ශනය සහ මාලඹේ බස්නැවතුම්පල සහ මහජන පොළ මූලික කරගනිමින් 1927 අත්පත්‍රිකා බෙදා හැරීම, මහජනතාව දැනුවත් කිරීම, බස් රථවල 1927 ස්ටිකර්ස් ප්‍රදර්ශන කිරීම සිදු කරන ලදි. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නිලධාරීන් දායකත්වය සපයන ලදි.







- සේදවත්ත සිවිල් ආරක්ෂක බලකා මූලස්ථානයේ නිලධාරී මණ්ඩලය සඳහා ලෝක මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව ජුනි මස 15 වන දින "මත්ද්‍රව්‍ය භාවිතයේ වර්තමාන තත්ත්වය" යන මැයෙන් දේශනයක් පවත්වන ලදි.





- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය හඳුන්වා දෙමින්, "දරුවන් මතින් වළක්වා ගැනීම සඳහා දෙමාපියන්ගේ අවබෝධය දියුණු කිරීම" වැඩසටහන 2022.06.25 දින දොම්පේ මාතෘ සායනයේ දී සිදුකරනු ලැබූ අතර ඒ සඳහා කාන්තාවන් 45 සහභාගී විය. එමෙන්ම 2022.06.28 වන දින හොරගල කාන්තා සමිති සාමාජිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. ඒ සඳහා කාන්තාවන් 26 දෙනෙකු සහභාගී විය







- දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූ සේවාලාභීන්, විශෝධනයට ලක් කළ සේවාලාභීන්, සමෘද්ධිලාභී පවුල්වල මත්ද්‍රව්‍ය භාවිතයට සම්බන්ධ පුද්ගලයින් සඳහා "සතුටින් පිරි සාර්ථක ජීවිතයක්" යන තේමාව යටතේ 2022.06.28 වන දින දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී වැඩසටහනක් පැවත්විණ. මෙම වැඩසටහන දෙහිවල ප්‍රාදේශීය ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන්, ප්‍රජා විශෝධන නිලධාරීන්, සමෘද්ධි කළමනාකාරතුමිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් සිදු කෙරුණ.






- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව බදුල්ල කම්මානම්කඩ (Kammanamkada) විහාරස්ථානයෙහි විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් දහම් පාසල් දරු දැරියන්ට මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් පවත්වන ලදි. මෙහිදී දරු දැරියන් විසින් නිවාරණ පණිවුඩ රැගත් විවිධ නිර්මාණයන් ද ඉදිරිපත් කරන ලද අතර 1927 ක්ෂණික දුරකථන අංකය පිළිබඳව ද දැනුවත් කරන ලද









- සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සීතාවක හා පහත්ගම යන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල පුහුණුලාභීන් 67 දෙනෙකු සඳහා 2022.06.07 හා 2022.06.22 යන දිනවල දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. එහි මූලික අරමුණ වූයේ, වෘත්තිය පුහුණුලාභින් මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත වැරදි සඳහා යොමු වීමට ඇති අවදානම් සාධක හඳුන්වා දීම සහ එවැනි අවදානම් අවස්ථා සඳහා සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය කුසලතා පිළිබඳව දැනුවත් කිරීම විය.



- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව 2022.06.21 වන දින හෝමාගම ලංකා ගමනාගමන මණ්ඩලයේ රියැදුරන්, කොන්දොස්තරවරුන් සහ කාර්යය මණ්ඩලය සඳහා මත්ද්‍රව්‍ය ගැටලුවෙහි පවතින වර්තමාන තත්ත්වය, බලපෑම සහ ප්‍රතිකාර පිළිබඳව දැනුවත් කිරීමේ සහ සාකච්ඡා කිරීමේ වැඩසටහනක් හෝමාගම ඩිපෝවේ දී සිදුකළ අතර 1927 ක්ෂණික දුරකථන ඇමතුම් අංකය ප්‍රචාරණය කිරීම සහ ප්‍රතිකාර ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ විය හැකි තොරතුරු ඇතුළත් දැන්වීම් පත්‍රිකාවක් බෙදා දීම සිදු කරන ලදි.

- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ප්‍රවාහනයට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව 2022.06.28 වන දින මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමේ අරමුණින් ප්‍රතිකාර ක්‍රියාවලියට යොමුවිය හැකි ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ජංගම වැඩසටහනක්, ජනතාව මෙම දිනවල නිතර ගැවසෙන ස්ථාන වන පිරවුම් හල්, ගෑස් සපයන ස්ථාන, මහජන පොළ, දුම්රිය ස්ථානය සහ වෙළෙඳ සැල් ඉලක්ක කරගනිමින් හෝමාගම ප්‍රදේශයේදී සිදුකළ අතර 1927 ක්ෂණික දුරකථන ඇමතුම් අංකය ප්‍රචාරණය කිරීම සහ ප්‍රතිකාර ක්‍රියාවලිය සඳහා ඍජුව සම්බන්ධ විය හැකි තොරතුරු ඇතුළත් දැන්වීම් පත්‍රිකාවක් ප්‍රදර්ශනය කරන ලදි.







- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව 2022.06.23 වන දින ගාල්ල කරාපිටිය රෝහලේ මානසික සෞඛ්‍ය සායනයේ ප්‍රතිකාර සඳහා පැමිණෙන සේවාලාභීන් අතරින් මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සම්බන්ධ කරගනිමින් කරාපිටිය වෛද්‍ය පීඨයේ පුහුණු වෛද්‍ය කණ්ඩායම දැනුවත් කිරීම සහ සේවාලාභීන්ගේ අත්දැකීම් තුළින් වෛද්‍ය වෘත්තියට අවශ්‍ය උපදේශනාත්මක මැදිහත් වීම ලබාදීම. එමෙන්ම කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් හා දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථ රියැදුරන්, පාසල් වෑන් රථ රියැදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.









- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ නීතිවිරෝධී ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයට සමගාමීව සැමරුම් උත්සවය යාපනය බස් නැවතුම්පලේ දී ආරම්භ වූ අතර එය යාපනය දිස්ත්‍රික් ලේකම්තුමාගේ මූලිකත්වයෙන් හා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූලිකත්වයෙන් සංවිධානය කරන ලදි. මේ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සහභාගී විය. එහිදී චෙන්මිකම් නම් නාට්‍ය ඉදිරිපත් කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වුණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 හි 1927 ක්ෂණික දුරකථන අංකය ප්‍රචාරණය කිරීම සඳහා ස්ටිකර් හා පෝස්ටර් ප්‍රදර්ශනය කරන ලදි.













## ”මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ පත්‍රිකා එකතුව, වෙළුම - VI” එළිදැක්වීම

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ (NDDCB) පර්යේෂණ අංශය ”මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණ පත්‍රිකා එකතුව, වෙළුම - VI” එළිදැක්වීමේ උත්සවය 2022 ජුනි 1 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ශ්‍රවණාගාරයේදී, සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ යන අයගේ සහභාගීත්වයෙන් සාර්ථකව අවසන් කරන ලදි. පර්යේෂණ සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්, KIU හි සාමාජිකයින් සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි අනෙකුත් කාර්ය මණ්ඩලය ද මේ සඳහා සහභාගී විය.

මෙය පර්යේෂණ අංශයේ වාර්ෂික ප්‍රකාශනයක් වන අතර එම අංශය මඟින් සිදුකරනු ලබන සියලුම පර්යේෂණ අධ්‍යයනයන්හි පර්යේෂණ පත්‍රිකා ඇතුළත් වේ. සඟරාව එළිදැක්වීමට සමගාමීව KIU පර්යේෂණ කණ්ඩායම විසින් පවත්වන ලද "ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනය කරන පුද්ගලයින් පිළිබඳව අප දන්නා දේ” පිළිබඳ පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමේ සැසියක් පැවැත්විණි.

මෙම ග්‍රන්ථය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් පිටුවෙහි ද ප්‍රකාශයට පත් කර ඇත. පහත වෙබ් සබැඳිය හරහා ඔබ සැමට සඟරාව වෙත ප්‍රවේශ විය හැක.www.nddcb.gov.lk










for the Discussion






Environment
DRUG
Brain Mechanisms
Addiction



## රටේ උද්ගතව ඇති ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස රාජ්‍ය ආයතනයන්හි වගා කටයුතු ආරම්භ කිරීම

රටේ උද්ගතව ඇති ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස රාජ්‍ය ආයතනයන්හි වගා කළ හැකි සෑම බිම්කඩක්ම ප්‍රයෝජනයට ගනිමින් එළවළු, පළතුරු වගා කිරීමේ අදහස ක්‍රියාවට නැංවීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මියගේ උපදෙස් පරිදි එතුමියගේ මූලිකත්වයෙන් මණ්ඩලීය පරිශ්‍රයේ දී 2022.06.06 වන දින සිදුකරන ලදි. මේ අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජනරාල් එච්.ඒ.ඒ.එන් ජයවර්ධන මහත්මිය ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිලධාරින් සහ ආයතනික නිලධාරින් සහභාගී වූහ.









# ARTICLES

## ගැබ්ගෙළ පිළිකාව

ගැබ්ගෙළ පිළිකාව යනු වැළැක්විය හැකි බෝනොවන රෝගයකි. ගැබ්ගෙළ පිළිකාව මේ වන විට ලෝකය පුරා විහිදී පවතින කාන්තාවන් මුහුණ දෙනු ලබන ප්‍රධානතම පිළිකා වර්ගයක් ලෙස සඳහන් කළ හැකිය. නමුත් මෙම රෝගී තත්ත්වය වළක්වා ගැනීමේ අවස්ථාව පවතී. ලොව බෙහෝ මරණ සිදු වන්නේ අඩු හා මධ්‍ය ආදායම් ලබන රටවල සිටින කාන්තාවන් අතරින්ය. එනම් "කාන්තාවන්ගෙන් 80% ක් මෙම රෝගී තත්ත්වය නිසා මිය යන බව අනාවරණය කරගෙන ඇත. ලොව පුරා මිලියන 1.4 ක් පිරිසක් මෙයට මුහුණ දී ඇති අතර දිනපතා 450 000ක පිරිසක් දිනපතා මෙම සංඛ්‍යාවට එක් වේ (Dr.D.Gamage,2015). තවද ආසන්න වශයෙන් "ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ජනගහනයෙන් වයස අවුරුදු 15 හෝ ඊට වැඩි වයස් සීමාවල කාන්තාවන් මිලියන 8.56 ක පිරිසක් ගැබ්ගෙල පිළිකා ඇති වීමේ අවදානම් මට්ටමක සිටින අතර, සෑම වසරකම මෙම පිළිකා තත්ත්වයට මුහුණ දෙනු ලබන කාන්තාවන් 1407 දෙනෙකු හඳුනා ගන්නා බවත්, ඉන් 780 ක් මෙම තත්ත්වය නිසා මිය යන බවත් ඇස්තමේන්තු කර ඇත" (Human Papillomavirus and Related Cancers, Fact Sheet 2021) .

හියුමන් පැපිලෝමා වෛරසය දීර්ඝ කාලීනව පැවතීම නිසා ගැබ්ගෙලෙහි අපිච්ඡද පටකයෙන් ඔබ්බට සෛල වර්ධනය වීම නිසා මෙම පිළිකා වර්ගය ඇති වේ. මුත්‍රා මාර්ගය, වකුගඩු වැනි ඉන්ද්‍රියන් සඳහා වඩාත් ඉක්මණින් මෙම පිළිකා තත්ත්වය පැතිරී යයි. නමුත් මූලික අවධිය තුළ මේ පිළිබඳව දැනුවත් භාවයක් ලැබීමෙන් ඉන් වන හානිය අවම කර ගනිමින් ජීවිත ආරක්ෂා කර ගැනීමට හැකියාව පවතී.

**ගැබ්ගෙළ පිළිකා ඇති වීමට බලපාන සාධක**


- අඩු වයසින් ලිංගික ජීවිතය ආරම්භ කිරීම
- බහු පුරුෂ සේවනය
- දුම්පානය කිරීම
- ප්‍රතිශක්තිය අඩු කරන AIDS , සමහර ඖෂධ හා මත්ද්‍රව්‍ය වර්ග

**රෝග ලක්ෂණ**

- මූලික අවධියේ දී රෝග ලක්ෂණ නොපෙන්වයි
- යෝනි මාර්ගයෙන් දුර්ගන්ධයක් පිට වීම
- මාසික ශුද්ධිය නතර වුවද ඇතැම් විට රුධිරය පිට වීම
- ලිංගික ක්‍රියාවලියෙන් පසු රුධිර වහනය වීම

**ප්‍රතිකාර හා රෝගය වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග**

- පැප් පරීක්ෂාව සිදු කිරීම - වයස අවුරුදු 35ට වැඩි කාන්තාවන් මෙය සිදු කළ යුතුය.
- 7 හා 8 යන ශ්‍රේණි වල ඉගෙනුම ලබන ගැහැණු දරුවන් සඳහා HPV ලබා දීම.
- රෝගී තත්වය හඳුනා ගැනීමෙන් පසු කීමො තෙරපි, රේඩියෝ තෙරපි හෝ ශෛල්‍යකර්ම සිදු කළ යුතුය.




**විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු**

**සභාපතිනිය**

**අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය**


## මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්

## (2000 - 2020)

**හැඳින්වීම**

2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වීම් පිළිබඳ ප්‍රවණතාව මේ හරහා විශ්ලේෂණයට ලක් කර ඇත.

**දත්ත විශ්ලේෂණය**




- මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි අත්අඩංගුවට පත්වීම් පිළිබඳ සලකා බැලීමේදී ඒ ඒ වර්ෂයන්ට අදාළව විවිධ වෙනස්කම් දක්නට ලැබෙන අතරම මෙතම්පිටමින් භාවිතය 2018 වර්ෂයේ සිට හඳුනාගෙන ඇත.

- ගංජා සම්බන්ධව අත්අඩංගුවට පත්වීම් පිළිබඳව පවතින දත්ත අනුව 2015 හා 2018 වර්ෂ වලදී වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට පත් වී ඇත. එය 2015 වර්ෂයේ දී 52,076 හා 2018 වර්ෂයේ දී 54,686 ලෙස දැක්විය හැකිය.

- හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට පත්වීම් සලකා බැලීමේ දී 2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ක්‍රමයෙන් වැඩිවීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. එය 2000 වර්ෂයේ දී 10,463 ක් ද, 2020 වර්ෂයේ දී 51,603 ක් ද ලෙස සඳහන් වේ.

- අබිං ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත්වීම් සලකා බැලීමේදී යම් අඩුවැඩි වීම් දැකගත හැකිවිය.

- මෙම දත්ත විශ්ලේෂණයේදී අනාවරණය කර ගත හැකි වූ වැදගත් කරුණ නම් මෙතම්පිටමීන් භාවිතය නිසා අත්අඩංගුවට පත්වීම් 2018 වසරේ දී මුල්වරට වාර්තා වී ඇති අතර, එය 257 ක ප්‍රමාණයකි. නමුත් මෙම තත්ත්වය වසර දෙකක් ඇතුළත එනම්, 2020 වර්ෂය වනවිට 2387 දක්වා සීඝ්‍ර වැඩිවීමක් දැක ගත හැකිය. එනම් වර්තමානය වන විට පුද්ගලයින් අතර මෙතම්පිටමින් භාවිතය ඉහළ ගොස් ඇති බව අනාවරණය විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත් , 2000 - 2020, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රාජගිරිය.

- මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත පද්ධතිය


පර්යේෂණ අංශය


## මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර සේවාවන්ට ඇතුළත්වීම (2000 - 2021)

### හැඳින්වීම

2007 අංක 54 දරන පනත අනුව ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පනත ප්‍රකාරව රාජ්‍ය සහ රාජ්‍ය නොවන යන දෙයංශයන්ම බහුවිධ ප්‍රතිකාර ක්‍රමවේදයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. 2000 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සේවාලාභීන් ප්‍රතිකාර සඳහා ඇතුළත්වීමේ ප්‍රවණතාවය පිළිබඳ පහත විශ්ලේෂණයට ලක් කර ඇත.

### දත්ත විශ්ලේෂණය.

ප්‍රස්තාර : 01 ප්‍රතිකාර සේවාවන් සඳහා ඇතුළත් වූ සේවාලාභීන් සංඛ්‍යාව





(මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2000-2021).

2000 සිට 2021 වර්ෂය දක්වා මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සඳහා සේවාලාභීන් ඇතුළත්වීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී 2001 වර්ෂයේ සේවාලාභීන් ඇතුළත්වීමේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. නමුත් 2001 න් පසුව මධ්‍යස්ථානවෙත සේවාලාභින් ඇතුළත් වීමේ අඩුවීමක් දක්නට ලැබෙන අතර 2011 වර්ෂය වන විට ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා ඇතුළත්වීමේ ප්‍රමාණය සැලකිය යුතු මට්ටමේ අඩුවීමක් දක්නට ලැබේ. 2016 වර්ෂයේ සිට ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා ඇතුළත්වීම් ක්‍රමිකව වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇති අතර 2018 වර්ෂය තුළ කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබේ. 2020, 2021 වර්ෂ තුළ කොවිඩ් 19 වසංගතය රට තුළ ව්‍යාප්ත වීම සහ රට තුළ විවිධ අවස්ථාවන්වලදී සංචරණ සීමා දැඩි කිරීම හේතුවෙන් ප්‍රතිකාර සඳහා සේවාලාභීන් යොමු වීමේ අඩු ප්‍රවණතාවයක් නිරීක්ෂණය වේ.

**ස්ත්‍රී පුරුෂභාවය අනුව ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම (2000-2021)**

ප්‍රස්තාර : 02 ස්ත්‍රී පුරුෂභාවය අනුව ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම





(මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2000-2021).

ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවාලාභීන් ප්‍රතිකාර සඳහා ඇතුළත්වීමේදී පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රීන් ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම 2000 වර්ෂයේ සිට ඉතා අවම මට්ටමක පවතින අතර එය මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූ ස්ත්‍රී ජනගහනයට සාපේක්ෂ වේ.

**ප්‍රතිකාර සේවාවන් මඟින් ආවරණය කරන ලද පුද්ගලයින් ප්‍රතිශතය (2015-2021).**

ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත හෙරොයින් භාවිත කරන පුද්ගලයින්ට සාපේක්ෂව ප්‍රතිකාර සේවාව මඟින් ආවරණය වන පුද්ගල සංඛ්‍යාව පිළිබඳ අවදානය යොමු කිරීමේදී, 2015 වර්ෂයේ 2.6% ක ප්‍රතිශතයක් ද, 2016 වර්ෂයේ 4.8% ක ප්‍රතිශතයක් ද, 2017 වර්ෂයේ 4.9% ක ප්‍රතිශතයක් ද, 2018 වර්ෂයේ 7.9% ක ප්‍රතිශතයක් ද, 2019 වර්ෂයේ 3.9% ක ප්‍රතිශතයක් ද, 2020 වර්ෂයේ 2.3% ප්‍රතිශතයක් ද සහ 2021 වර්ෂයේ 2.4% ක ප්‍රතිශතයක් ද වශයෙන් ප්‍රතිකාර සේවාවක් විසින් අදාළ ඉලක්ක කණ්ඩායම ආවරණය කර ඇත.

ප්‍රස්තාර : 03 ප්‍රතිකාර සේවාවන් මගින් ආවරණය කරන ලද පුද්ගලයින් ප්‍රතිශතය




**සාරාංශය**

- ❖ අනෙක් වර්ෂවලට සාපේක්ෂකව 2020, 2021 වර්ෂයේදී කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සේවාලාභීන් ඇතුළත් කරගැනීමේ අඩු ප්‍රවණතාවක් දක්නට ලැබීම.
- ❖ ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත මත්ද්‍රව්‍ය භාවිත කරන ජනගහනයට සාපේක්ෂව ප්‍රතිකාර සේවාවන් මගින් ආවරණය කර ඇති පුද්ගල ප්‍රතිශතය (Treatment coverage) ඉතා අවම මට්ටමක පවතියි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2000 - 2021.


පර්යේෂණ අංශය

## 🕮....සිතුවිලි සයුර....✎

පරිසර ගීතය    ඉෂාර රංග බංඩාර

- දෙව් ලොව දී මවු බිමට දෙවැනි කොට සිතන්නෙමු
  දෙව් ලොවේ නැති අසිරි මවු බිමේ දකින්නෙමු
  පරිසරය රකින්නෙමු වඩන්නෙමු වවන්නෙමු
  මේ විලිනයෙන් සැදූ මවු බිමට බැඳෙන්නෙමු

- වලා සිඹින ගලා යනා හදී දිය නිරතුරු යි
  වන උයන් මල් උයන් පල උයන් විසිතුරු යි
  සිසිලසින් පණ පොවනා මද පවන සිවිතුරු යි
  පරිසරය රැකෙනා තුරු සොබාදම සුවිතුරු යි

- නන්නාව ආසාව ඇයි ද සොබාදහමේ
  රැමටි වන සම්පත ඇයි පොළොව නගන්නේ
  සොබාදම සිපුණු දා සත් වග මැ නසන්නේ
  පරිසරය රකින්නේ මුළු රට මැ රකින්නේ

- මේ මිහි මඬල පසන සැම සිතෙහි මෙත වැඩේවා!
  ගහ කොළට පවා ඒම මෙත් සිසිල දිනේවා!
  බිම සෝග සම්පතින් සතට සෙත සැලේවා!
  අපේ හුස්මෙන් පවා පරිසරය ජීවේ වා! //



# NDDCB Treatment Centres



Talangama
"Talangama" Prevention, Treatment & Center
172, Shanthi Mawatha Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk




Nawadiganthaya
"Nawadiganthaya" Prevention, Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



Galle
"Galle" Prevention, Treatment & Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk



Kandy
"Kandy" Youth Prevention, Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa, Peradeniya
Tel : +94 81 2315504
Fax : +94 81 2315504
Email : methsevana@nddcb.gov.lk

**Tel – 011 2868794 - 6**
**Web -https://www.nddcb.gov.lk/**
**Fb – National Dangerous Drug Control Board.**